ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුවේ

පළමුවැනි සභාවාරය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 318

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

තෙවැනි වාර්තාව

(2025.04.02 දින සිදු කරන ලද විමර්ශනය)

විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු කබීර් හෂීම් මහතා විසින් 2025 ඔක්තෝබර් මස 24 වැනි දින ඉදිරිපත් කරන ලදී.

2025 ඔක්තෝබර් මස 24 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි පහත පරිදි දක්වා ඇත:-

"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර ආමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට අරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය."

<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>
<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>

1. ගරු කබීර් හෂීම් මහතා (2025.03.21 දින සිට) (සභාපති - 2025.09.12 දින සිට)
2. ගරු ඇන්ටන් ජයකොඩි මහතා
3. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
4. ගරු සුගත් තිලකරත්න මහතා
5. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (2025.03.21 දින සිට)
6. ගරු නලින් හේවගේ මහතා
7. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා (2025.03.21 දින සිට)
8. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (2025.03.21 දින සිට)
9. ගරු ජේ.සී. අලවතුවල මහතා (2025.03.21 දින සිට)
10. ගරු චාමර සම්පත් දසනායක මහතා (2025.03.21 දින සිට)
11. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා (2025.03.21 දින සිට)
12. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා (2025.03.21 දින සිට)
13. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා (2025.03.21 දින සිට)
14. ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
15. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
16. ගරු කේ. ඉලංකුමාරන් මහතා
17. ගරු ඔෂානි උමංගා මහත්මිය
18. ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා (2025.03.21 දින සිට)
19. ගරු රුවන්තිලක ජයකොඩි මහතා
20. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය (2025.03.21 දින සිට)
21. ගරු ටී.කේ. ජයසුන්දර මහතා (2025.03.21 දින සිට)
22. ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා (2025.03.21 දින සිට)
23. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
24. ගරු ලාල් ප්‍රේමනාත් මහතා
25. ගරු චානක මාදුගොඩ මහතා (2025.03.21 දින සිට)
26. ගරු සුනිල් රත්නසිරි මහතා (2025.05.08 දින සිට)
27. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා
28. ගරු චන්දන සූරියආරච්චි මහතා
29. ගරු අරවින්ද සෙනරත් මහතා
30. ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

කාරක සභා ලේකම් කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය

- කාන්ති පීරිස් මහත්මිය - කාරක සභා ලේකම්/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
- සනත් විජේගුණවර්ධන මයා - ප්‍රධාන නිලධාරි
- ආර්. ඒ. ඩී. එන්. ගියෝවනී මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි
- ජේ. ටී. එල්. පී. සමීර මයා - සහකාර ප්‍රධාන නිලධාරි
- ජී. ඩී. ජේ. එච්. අයේෂ්මන්ති මෙය - පාර්ලිමේන්තු නිලධාරි
- ජී. එම්. කල්ලෑගොඩ මිය - පාර්ලිමේන්තු නිලධාරි

කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා බා ගත කර ගැනීමට හැක.

Select language ⟶ Business of Parliament ⟶ Committees ⟶ Committee Reports ⟶ Select Legislature (10th Parliament) ⟶ Select Session (1st Session) ⟶ Select Committee Type ⟶ (Comittees for Special Purposes) ⟶ Select Committee ⟶ (Committee on Public Accounts) ⟶ Search

<u>විමර්ෂණයට අදාළ විගණකාධිපති වාර්තාව</u>

2024 සැප්තැම්බර් 05 වන දින ඉදිරිපත් කරන ලද "විදේශ ප්‍රේෂණ මත, එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ විශේෂ විගණන වාර්තාව" www.auditorgeneral.gov.lk යන වෙබ් අඩවියෙන් පහත සබැඳිය ඔස්සේ බා ගත කර ගැනීමට හැක.

http://www.auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2024/special/Fully_Electric_vehicle/Fully-Electric-vehicle-Full-Document-2024.09.05.pdf

මෙම විමර්ෂනය සඳහා ඉහත සඳහන් විගණන වාර්තාව මඟින් අනාවරණය කරන ලද කරුණු පාදක කොට ගෙන ඇති අතර කාරක සභාවේදී සාකච්ඡාවට ලක් කරන ලද කරුණුවලට අදාල වැඩිමනත් තොරතුරු එම විගණන වාර්තාවේ අන්තර්ගත වේ.

පටුන

a. සභාපතිවරයාගේ සටහන 7

b. සංක්ෂිප්ත වාර්තාව 9

c. පසුබිම 10

d. විමර්ශනයේ දී හඳුනාගත් ගැටළු සහ නිරීක්ෂණ 12

e. සමාලෝචනය 19

f. කාරක සභාවේ නිර්දේශ 20

g. ඇමුණුම් 22

සභාපතිවරයාගේ සටහන

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විදෙස් ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ 2025.04.02 දින සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ තෙවැනි වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (3) හි විධිවිධාන ප්‍රකාරව මම අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත පවරා ඇති රාජ්‍ය මූල්‍ය පාලන බලතල හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලසා ඇති බලතල අනුව මූල්‍ය අධීක්ෂණ කාරක සභාවක් වශයෙන් කටයුතු කරනු ලබන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද පරීක්ෂා කිරීම මෙම කාරක සභාවේ මූලික කර්තව්‍ය වේ.

එම කර්තව්‍ය ඉටු කිරීමේදී විගණනය නමැති පශ්චාත් ක්‍රියාවලියෙන් කාරක සභාවට ලැබෙන දායකත්වය ඉමහත් වේ. නිවැරදි විගණනයක් තුළින් හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් ලබා දෙන අතරම, අකාර්යක්ෂමතාවයන් සක්‍රීයව වැළැක්වීම සඳහා අනාගතයේදී අතීත අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනවලට මඟ පෙන්වීමක්ද එතුළින් සිදුවේ.

රට තුළ උද්ගතව තිබූ ආර්ථික අර්බුදයෙන් මුදවා යහපත් ආර්ථිකයක් උදාකිරීම සඳහා පක්ෂ පාට බේද දුරලා පෙරට වඩා කැපවීමෙන් කටයුතු කිරීම දේශපාලන අධිකාරියේ වගකීමක් වන අතර, රාජ්‍ය ආයතනවල පවතින මූල්‍ය අක්‍රමිකතා හා දූෂණ වැළැක්වීමට නිසි පියවර ගැනීම සියලු රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම බව ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති වශයෙන් මා අවධාරණය කරනු කැමැත්තෙමි.

එසේම, රාජ්‍ය ආයතනවල මූල්‍ය විනය හා කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා කාරක සභාව මගින් දරනු ලබන ප්‍රයත්නය නිරර්ථක නොවීමට වගබලා ගැනීම දේශපාලන අධිකාරියේ මෙන්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීමක් වන බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුමය. කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කඩිනම් අවධානය යොමු කිරීම, සුදුසු විනය

ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම හා සියලු ක්‍රියාවන් සම්බන්ධයෙන් පසු විපරම් සිදු කරමින් අදාළ නිර්දේශ ක්‍රියාත්මකභාවයට පත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වන අතර ඉන් ඔබ්බට පවතින අපරාධමය වැරදි සඳහා නීතිපතිවරයාගේ මැදිහත්වීම ඇතිව අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම දේශපාලන අධිකාරියේ වගකීම වේ.

එබැවින් මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සුදුසු යොජනා සම්මුතියකින් අවශ්‍ය නෛතික ක්‍රියාදාමයන් වෙත යොමු කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව බලාපොරොත්තු වේ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය යන්නෙන් අදහස් වන්නේ ඊට දායක වන සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයේ ප්‍රතිඵලයයි. එබැවින්, රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් මෙතෙක් ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුගිය ගිණුම් කාරක සභා වල සේවය කළ සභාපතිවරුන් ඇතුළු සභික මන්ත්‍රීවරුන්ටත්, කාරක සභා කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මා හට පූර්ණ සහයෝගය ලබා දෙන වර්තමාන සභික මන්ත්‍රීවරුන්ටත් මාගේ කෘතඥතාවය පුද කරමි.

තවද, විවිධ අභියෝග මධ්‍යයේ වුවද කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් විගණකාධිපතිවරයාට හා එතුමාගේ කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුළු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලුම නිලධාරීන්ට ද කාරක සභාව සිය ස්තුතිය හා ප්‍රසාදය පිරිනමනු ලබන බව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

කබීර් හෂීම්
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

සංක්ෂිප්ත වාර්තාව

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 'විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය' පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කාරක සභාව විසින් පවත්වන ලද රැස්වීමෙහි පසුබිම, සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් කරන ලද පැහැදිලිකිරීම් සහ කාරක සභාව විසින් ලබාදෙන ලද නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ.

කාරක සභා රැස්වීම පවත්වන ලද දිනය - 2025.04.02

කැඳවන ලද ආයතන -

- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
    - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
    - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව
    - ශ්‍රී ලංකා රේගුව
    - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
    - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
    - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- කම්කරු අමාත්‍යාංශය
- ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
    - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

විමර්ශන සහාය: ජාතික විගණන කාර්යාලය

පසුබිම

විදෙස් ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ විගණකාධිපතිවරයා විසින් 2024.09.05 දිනැතිව විශේෂ විගණන වාර්තාවක් නිකුත් කරන ලදී.

ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදයන්හි පාරදෘශ්‍යතාව සහ අභ්‍යන්තර පාලනය, යොදාගත් නිර්ණායක, චක්‍රලේඛ නිකුත් කිරීම, වාහන ලියාපදිංචි කිරීම සහ බදු අයකරගැනීම්, මුදල් විශුද්ධිකරණ අවදානම ආදී කාරණාවන් පිළිබඳව වැඩිදුරට සාකච්ඡා කරන විශේෂ විගණන වාර්තාවේ අන්තර්ගතයේ සඳහන් මූලික තොරතුරු කෙටියෙන් පහත දක්වා ඇත.

1. එවන ලද ප්‍රේෂණ මත පදනම්ව, එනම් එම ප්‍රේෂණ වලින් සියයට 50ක උපරිමයක් දක්වා මි.ර.ගැ.(CIF) වටිනාකමක් සහිත විද්‍යුත් වාහනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබාදීමේ යෝජනා ක්‍රමයක් එවකට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

2. විගමනික ශ්‍රමිකයන් හට විද්‍යුත් වාහන ආනයන බලපත්‍ර ලබාදී විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රේෂණ ඉහළ නැංවීමේ අරමුණින් මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර තිබුණි.

3. 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා කාලය තුළ විදේශ ප්‍රේෂණ එවන ලද විදේශ ශ්‍රමික අයදුම්කරුවන් හට මෙම ප්‍රතිලාභ ලබා දීමට යෝජනා වී තිබුණි.

4. විදේශ ප්‍රේෂණ එවන ශ්‍රමිකයන්ට ලබාදී තිබූ විශේෂ ප්‍රතිලාභ:-

    4.1 වාහන ආනයනය තාවකාලිකව අත්හිටුවා තිබූ අවස්ථාවක විද්‍යුත් වාහනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා දීම.

    4.2 ආනයනය කරන වාහනයක් මත අයකරන සුඛෝපභෝගී බදු නිදහස් සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා ඉහළ නැංවීමෙන් බදු සහන ලබා දීම.

5. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයෙන් ලද තොරතුරු අනුව යෝජනා ක්‍රමය යටතේ 2022 සැප්තැම්බර් 22 සිට 2024 ජුනි 30 දක්වා කාලය තුළ බලපත්‍ර 1077ක් නිකුත් කර තිබූ අතර එයින් බලපත්‍ර 77ක් අවලංගු කර තිබිණි.

6. 2024 මාර්තු 11 දින වනවිට වලංගු බලපත්‍ර 1000 අතුරින් බලපත්‍ර 921කට අදාළව පමණක් වාහන ආනයනය කිරීමට අදාළ බලපත්‍රලාභීන් කටයුතු කර තිබූ අතර එදිනට ආනයනික වාහනවලින් 699ක් පමණක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි.

7. 2024 ජුනි 30 දින වනවිට ඇමරිකානු ඩොලර් 121,505,640 ක් වූ විදෙස් ප්‍රේෂණ, යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රලාභී බැංකු වෙත ලැබී තිබූ අතර ආනයනිත වාහන 510 සඳහා ඇමරිකානු ඩොලර් 24,100,757 ක් විදේශ වෙත ගෙවා තිබුණි.

විමර්ශනයේ දී හඳුනාගත් ගැටළු සහ නිරීක්ෂණ

විදෙස් ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට 2022.05.01 සිට 2023.09.15 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය සම්බන්ධයෙන්, ඒ පිළිබඳව විගණකාධිපතිවරයා විසින් 2024.09.05 දිනැතිව නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තාවේ අන්තර්ගත කරුණු ද ඇතුළුව, පරීක්ෂා කිරීම සඳහා වූ රජයේ ගිණුම් කාරක සභාවේ රැස්වීමක් 2025.04.02 පාර්ලිමේන්තු කමිටු කාමර අංක 06 දී පැවැත්විණි.

එහිදී උක්ත යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර එහිදී අනාවරණය වූ කරුණු සහ කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු පහතින් දැක්වේ.

01. මෙම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ චක්‍රලේඛය අමාත්‍ය මණ්ඩල තීරණයට පරිබාහිරව නිකුත් කර තිබීම

මෙම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව බලපත්‍ර නිකුත් කිරීමේ බලය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආනයන හා අපනයන පාලකට ලබා දී ඇතත්, එම බලපත්‍ර නිකුත් කිරීම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කර තිබේ.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් චක්‍රලේඛයේ කෙටුම්පත සකස් කර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා ඇති අතර මුදල් අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්වරයාට යවන ලද ලිපියක් මගින් චක්‍රලේඛයේ කෙටුම්පත අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ඇතැම් කරුණුවලින් බැහැර වන බවට නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, අදාල නිරීක්ෂණයන්හි බලපත්‍ර නිකුත් කිරීමට කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයාට බලයක් නොතිබූ බව පෙන්වා දී නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.

ඒ අනුව, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ද තම වගකීම් නොසලකා හැර කටයුතු කර ඇති බවක් පෙනී යන බවද, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල තීරණය ද උල්ලංඝණය

කරමින් තම අධිකාරී බලය අවභාවිතා කර බලපත්‍ර නිකුත් කිරීම සිදු කර ඇති බවද කාරක සභාවේ නිරීක්ෂණය විය.

02. සකස් කරන ලද චක්‍රලේඛය පසු අවස්ථා කිහිපයකදීම සංශෝධනය කර තිබීම.

මුල් චක්‍රලේඛයේ අදාළ අයදුම්කරුවන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී සිටීම අවශ්‍ය බවට දක්වා තිබූ කොන්දේසිය පසුව ඉවත්කර "එතෙර රැකියාවක නියුතු ඕනෑම ශ්‍රී ලාංකිකයකු" ලෙස මෙම ව්‍යාපෘතිය යටතේ වාහන බලපත්‍ර හිමිකම් ලබන කාණ්ඩය නිර්වචනය කර ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.

මෙහිදී විදෙස්ගතව සිටිය යුතු කාල සීමාව නිශ්චිතව නොදැක්වීමෙන් හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය ඉවත් කිරීමෙන්, විදෙස්ගත නොවූ හා ඉතා කෙටි කාලයකට විදෙස් ගතවූ පුද්ගලයන්ට සහ සුදුසුකම් නොමැති පුද්ලයින්ට ද බලපත්‍ර ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇති බවද, මෙම ව්‍යාපෘතිය නිවැරදිව නියාමනය කිරීමට තිබූ හැකියාව අහිමිව ගොස් ඇති බවද කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

03. වාහන ආනයන පහසුකම් සැලැස්වීම සඳහා සමාගම් තෝරාගෙන ඇති ආකාරය ගැටළු සහගතවීම

වාහන ආනයන පහසුකම් සැලැස්වීම සඳහා සමාගම් 34 ක් ලියාපදිංචි කර තිබෙන අතර රට තුළට ගෙන්වා ලියාපදිංචි කළ වාහන 921ක් අතුරින් 640 ක් සඳහා සමාගම් දෙකක් විසින් (Overland Automobile සහ Auto Capital Investment යන සමාගම්) පහසුකම් සපයා තිබුණි.

මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනයට පහසුකම් සැපයීම සඳහා ආයතන තෝරා ගැනීම සඳහා යොදා ගෙන ඇති නිර්ණායක සහ අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳව කාරක සභාව විසින් ප්‍රශ්න කරන ලදී.

මෙහිදී, පසුකාලීනව අමාත්‍යාංශ විෂය පථයන් වෙනස්වීමට අනුකූලව විදේශ රැකියා අංශය, කම්කරු අමාත්‍යාංශයෙන් ඉවත්ව විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතට පත්වූවත්, උක්ත යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළ ලිපිගොනු තම අමාත්‍යාංශය වෙත විධිමත් ලෙස බාරදීමක් සිදු නොවූ බව විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි ප්‍රකාශ කර සිටියේය. තවද,

සමාගම් තෝරා ගැනීම සම්බන්ධයෙන් වෙබ් අඩවියේ පළ කළ දැන්වීමක්, ලැබුණු අයදුම්පත් ලැයිස්තුවක් සහ තෝරාගත් සමාගම්වල නාමලේඛනයක් තම අමාත්‍යාංශය වෙත ලැබී ඇති ලිපි ගොනුවල අන්තර්ගතවන නමුත් සමාගම් තෝරා ගැනීමේ නිර්ණායක හෝ සමාගම් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ සටහන් කිසිවක් ඒවායෙහි අඩංගු නොවන බව ද ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටියේය.

යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනයට පහසුකම් සැපයීම සඳහා ආයතන තෝරා ගැනීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් තොර බවද, අනුගමනය කර ඇති ක්‍රියාපරිපාටිය තෝරාගත් ආයතන කීපයකට පමණක් වාසි සැලසෙන පරිදි ක්‍රියාත්මක කර ඇති බවද කාරක සභාවේ නිරීක්ෂණය විය.

04. විදෙස් ගත නොවූ පුද්ගලයින් හට ද බලපත්‍ර නිකුත් කර තිබීම සහ ඇතැම් පුද්ගලයන්ට බලපත්‍ර 2 බැගින් නිකුත් කර තිබීම

විදෙස් ගත නොවූ පුද්ගලයින් 04 දෙනෙකුට සහ අයදුම්පත්‍රයේ රැකියාව සඳහන් කර නොතිබූ පුද්ගලයින් 61 දෙනෙකුට ද බලපත්‍ර නිකුත් කර ඇති බව ද, එක් පුද්ගලයෙකුට බලපත්‍ර 2ක් නිකුත් කළ අවස්ථා විගණනය විසින් පෙන්වා දීමෙන් අනතුරුව නිවැරදි කර තිබෙන බව ද විගණනය විසින් සඳහන් කරන ලදී. තවද, බලපත්‍රය සඳහා සුදුසුකම් ලැබීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී සිටිය යුතු බවට මුලින් දක්වා තිබූ කොන්දේසිය පසුව වෙනස් කිරීම තුළ ඒ පිළිබඳව සැලකීමකට භාජනය නොකර බලපත්‍ර නිකුත් කිරීම මඟින් නුසුදුසු පුද්ගලයින් හට බලපත්‍ර නිකුත් කිරීමට අවස්ථාව සැලසී ඇති බව පෙනීයන බව විගණකාධිපතිවරයා විසින් මෙහිදී තවදුරටත් පෙන්වා දෙන ලදී.

තම රාජකාරි කාලය තුළ විදේශගත ශ්‍රමිකයා යන්න හඳුනා ගැනීම සඳහා නිසි පරීක්ෂාවන් සිදු කළ බවත්, කිසිදු අවස්ථාවක එකම පුද්ගලයෙකුට බලපත්‍ර දෙකක් නිකුත් නොකළ බවත්, එවකට කම්කරු හා විදේශ රැකියා කටයුතු අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් කේ.ඩී.ආර්. ඔල්ගා මෙය මේ පිළිබඳව අදහස් දක්වමින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළාය. තවද, තමන් කෙටි කාලයකට පමණක් උක්ත තනතුරේ රාජකාරී සිදු කළ බව සහ ඇතිවූ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් 2023 අගෝස්තු 04 වන දින මෙම ක්‍රියාවලියෙන් ඉවත් වීමට සිදු වූ බව ඇය වැඩිදුරටත් පැවසීය.

මෙම සිද්ධීන් සම්බන්ධ මුල් ලේඛන වැඩිදුර විමර්ශනය සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී /ගණන් දීමේ නිලධාරී විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේය.

විදෙස් ගත නොවූ පුද්ලයින්ට බලපත්‍ර නිකුත් කර තිබීම සහ එක් පුද්ගලයකුට බලපත්‍ර 02 නිකුත් කර තිබීම යන කරුණු බරපතල පරිපාලන වැරදි බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

05. ආනයනය කරන ලද වාහන වෙනත් පාර්ශව වෙත පවරාදීම සහ එසේ පවරාදීමේදි බද්දක් අය කිරීම

මුල් අමාත්‍ය මණ්ඩල තීරණයේ ආනයනය කරන ලද වාහන වෙනත් පාර්ශවයකට පැවරීම සම්බන්ධයෙන් සඳහන් නොවූ නමුත්, පසුව ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අවසර ලබාදී ඇති බව කාරක සභාව හමුවේ ප්‍රකාශ විය. තවද, එලෙස පවරාදීමේදී අය කර ඇති බලපත්‍රයේ වටිනාකමින් 10% ක ගාස්තුව, ගැසට් පත්‍රයේ බද්දක් ලෙස සඳහන් කර තිබීම නිසා එය අයකර ගැනීමේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගැටළුකාරී තත්වයකට මුහුණ දීමට සිදුවී ඇති බව සහ ඇතැම් අවස්ථාවලදී මෙම බද්ද අය කරගෙන නොමැති බවද විගණනය විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

පාර්ලිමේන්තුවේ අනුමැතියක් රහිතව බද්දක් පැනවීම සිදුකළ නොහැකි හෙයින් එලෙස බද්දක් අයකර තිබීම නීත්‍යානුකූල නොවන බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

06. ආනයනය කරන ලද වාහනවලින් ඇතැම් ඒවා කොන්දේසි කාලසීමාවෙන් පසුව ලියාපදිංචි කර තිබීම සහ ඇතැම් ඒවා මේ දක්වාත් ලියාපදිංචි කර නොතිබීම

මෙම යෝජනා ක්‍රමය යටතේ මුළු බලපත්‍ර 1077ක් නිකුත් කර ඇති බවත්, ඒවා අතරින් විවිධ පරිපාලන හේතූන් මත බලපත්‍ර 77ක් අවලංගු කර ඇති බවත්, වලංගු බලපත්‍ර මගින් වාහන 921 ක් ආනයනය කර ඇති බවත් කාරක සභාව හමුවේ ප්‍රකාශ විය. කෙසේ වෙතත්, ඉන් වාහන 699ක් පමණක් මේ වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති හෙයින් ඉතිරි වාහනවල තත්ත්වය සහ ඒවා කවුරුන් සතුව පවතී ද යන්න පිළිබඳව විමර්ශනයක් මෙතෙක් සිදු කර නොමැතිවීම කෙරෙහි ද කාරක සභාවේ අවධානය යොමු විය.

බලපත්‍ර නිකුත් කිරීමේ දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන 9කට ඒවායෙහි පිටපත් යොමු කරන බව දක්වා තිබුණ ද නිකුත් කළ බලපත්‍ර අතුරින් සුළු සංඛ්‍යාවක පමණක් පිටපත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබෙන බව කාරක සභාව හමුවේ ප්‍රකාශ විය. එබැවින්, මෙතෙක් ලියාපදිංචි කර නොමැති වාහනවල තත්ත්වය සහ ඒවා කා සතුව පවතී දැයි නොදන්නා බව ද, ඒ පිළිබඳව විමර්ශනයක් තම ආයතනය විසින් මෙතෙක් සිදු කර නොමැති බව ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී.

බලපත්‍ර කොන්දේසි ප්‍රකාරව ආනයනය කළ වාහන 2024 සැප්තැම්බර් 30 වන දිනට පෙර ලියාපදිංචි කළ යුතු බවට මූලිකව නියම කර තිබුණු හෙයින් එම කාල සීමාවෙන් පසුව මේ යෝජනා ක්‍රමය යටතේ වාහන ලියාපදිංචිය තාවකාලිකව නතර කර එසේ ප්‍රමාදවී ඉදිරිපත්වන අයදුම්පත් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්ගෙන් සහ මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් පැතූ බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. තවද, ඒ අතරතුර ආනයනික වාහන ලියාපදිංචිය සඳහා බලපත්‍රලාභියෙකු සහ බලපත්‍රලාභියෙකුගෙන් වාහනය මිලදී ගත් අයෙකු යනාදී වශයෙන් පාර්ශ්ව 02ක් විසින් අධිකරණයේ රිට් පෙත්සම් දෙකක් ගොනු කර තිබූ බවද, එම පෙත්සම් සලකා අභියාචනාධිකරණය විසින් නිකුත් කර ඇති අතුරු නියෝගය ප්‍රකාරව, රජය විසින් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ගන්නා ඕනෑම ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වන බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමෙන් අනතුරුව මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනිත තවත් වාහන 55ක් ලියාපදිංචි කිරීම සිදුකළ බවත් හෙතෙම කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

උක්ත යෝජනා ක්‍රමය යටතේ සුබෝපභෝගී වාහන සඳහා බදු රහිත සීමාව රුපියල් මිලියන 6 සිට මිලියන 12 දක්වා වැඩි කර තිබෙන බවත් ඒ හේතුවෙන් සාමාන්‍ය ක්‍රමවේදය තුළ රජයට හිමිවිය යුතු රුපියල් බිලියන 2.4 ක පමණ බදු ආදායමක් අහිමි වී ඇති බවත් මෙහිදී විගණන අංශය විසින් පෙන්වා දෙන ලදී.

මෙලෙස ආනයනිත වාහන 2024 සැප්තැම්බර් මස 30 දිනට පෙර ලියාපදිංචි කළ යුතු බවට වූ කොන්දේසියකට යටත් කර තිබූ බැවින්, ඒකී දිනෙන් පසුව තවදුරටත් ඒවා ලියාපදිංචි නොකර තබා ගැනීම නීති විරෝධී වන බව සහ ලියාපදිංචි නොකර එලෙස තවදුරටත් තබාගෙන ඇත්තේ ඒවා භාවිතය සඳහා නොව වෙනත් පාර්ශවයන්ට විකිණීම සඳහා ව්‍යාපාරික පරමාර්ථයෙන් යුතුව ආනයනය කර තිබීම නිසා බව පැහැදිලිව ගම්‍ය වන

බව කාරක සභාවේ නිරීක්ෂණය විය. තවද, බලපත්‍ර කොන්දේසි ප්‍රකාරව, නිශ්චිත කාලරාමුව තුළ ආනයනය කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ වාහන උක්ත බදු නිදහස් කිරීම්වලට යටත් වන නමුදු එම නියමිත කාලසීමාව තුළ ලියාපදිංචි නොකළ වාහන සඳහා එම බදු නිදහස හිමි නොවන බව ද කාරක සභාවේ නිගමනය විය.

රට තුළට ගෙන්වනු ලබන සියලුම වාහන සඳහා සුබෝපභෝගී බදු අය කිරීම ශ්‍රී ලංකා රේගුව විසින් සිදුකරන බැවින් ද, මෙම යෝජනා ක්‍රමය යටතේ මෙරටට ගෙන්වූ මෝටර් රථ දැනටමත් රේගුවෙන් නිෂ්කාශනය කර ඇති බැවින් ද, බලපත්‍ර කොන්දේසි කාලය තුළ ලියාපදිංචි නොකළ වාහන ඉදිරියේදී ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වුවහොත් එම වාහන සඳහා සුබෝපභෝගී බදු අය කරන්නේ කෙසේද යන කරුණ පිළිබඳව ද කාරක සභාවේදී දීර්ඝ ලෙස සාකච්ඡාවට ලක්විය.

එහිදී, ඉදිරියේදී ගනු ලබන තීරණ අනුව එලෙස මෙතෙක් ලියාපදිංචි නොවූ වාහන ලියාපදිංචි කිරීමට කටයුතු කළහොත් එම අවස්ථාවේ දී සුබෝපභෝගී බදු මුදල් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් අය කර ගැනීමට නෛතික ගැටළු පවතින බව ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර ඇති, ඉදිරියේදී ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන වාහන වෙතොත් එම වාහන සම්බන්ධයෙන් සුබෝපභෝගී බදු අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැකසිය යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

07. විදෙස් ප්‍රේෂණවලින් 50% ක ප්‍රමාණය ඉක්මවා වාහන ආනයනය කර තිබීම

අදාළ යොජනා ක්‍රමයට අනුව බලපත්‍රලාභීන් විසින් යෝජනා ක්‍රමයේ දක්වා තිබූ කාලරාමුව තුළ රට තුළට එවන ලද විදෙස් ප්‍රේෂණ වලින් උපරිම 50% ක ප්‍රමාණයක් පමණක් භාවිතා කරමින් වාහන ආනයනය සිදුකළ යුතු නමුත් විදේශ ප්‍රේෂණ ප්‍රමාණයෙන් 50% ඉක්මවා ගිය බලපත්‍ර 16 ක් නිකුත් කර ඇති බවට විගණනය විසින් කරුණු අනාවරණය කර තිබුණි.

තවද, බලපත්‍ර ලබාගෙන වාහන ආනයනය කිරීමෙන් අනතුරුව රට තුළට ප්‍රේෂණය කළ ඉතිරි විදෙස් ප්‍රේෂණ ප්‍රමාණය ඉවත් කරගෙන තිබේද යන කරුණ පිළිබඳව මෙම යෝජනා ක්‍රමයේදී අවධානය යොමුකර නොතිබූ බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.

චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු අනෙකුත් බැංකු සමඟ සාකච්ඡා කළ බවත්, විදේශ බැංකුවලින් එන මුදල් හුවමාරු පිළිබඳ තොරතුරු අමාත්‍යාංශ මට්ටමින් රජයේ නිලධාරීන්ට පරීක්ෂා කිරීමට නොහැකි හෙයින් උක්ත කරුණට අදාළව බැංකු විසින් ලබාදෙන තහවුරුව මත විශ්වාසය තබා කටයුතු කළ බවත්, මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස කටයුතු කළ කේ.ඩී.ආර්. ඔල්ගා මෙය ප්‍රකාශ කර සිටියාය.

තවද, මෙම යෝජනා ක්‍රමය යටතේ මුදල් විශුද්ධිකරණයට සම්බන්ධ ක්‍රියාවන් සිදුවීම වැළැක්වීමට අවශ්‍ය නිසි පියවරයන් අනුගමනය කර තිබුණේද යන්න පිළිබඳව ද කාරක සභාව විසින් විමසන ලදී.

මුදල් විශුද්ධිකරණයට අදාළ පරීක්ෂාවන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය හරහා පමණක් සිදුකිරීමට හැකියාව පවතින බවත් එම ඒකකය ඔස්සේ මේ පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා විශේෂ විගණන වාර්තාව මඟින් නිර්දේශ කර ඇති බවත් විගණන අංශය විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

සමාලෝචනය

මෙරට දැඩි ආර්ථික අර්බුදයට මුහුණදී සිටි අවධියක රට තුළ පැවැති ඩොලර් සංචිත හිඟය සඳහා සුළු වශයෙන් හෝ පිළියමක් ගෙන ඒමේ අරමුණ සහිතව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත. කෙසේ වෙතත් ව්‍යාපෘතිය එකී මුඛ්‍ය අරමුණ සඳහා මෙහෙයවීම පසෙකලා රට තුළට වාහන ආනයනය සීමා කර තිබූ අවධියක, තෝරා ගත් පිරිසකට පමණක් විශේෂ වරප්‍රසාද හා වාසි සැලසෙන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල බලධාරීන් විසින් ක්‍රියාකර ඇති බවත්, එම ක්‍රියාදාමය තුළ අනීතික ක්‍රියා සහ අක්‍රමිකතා ගණනාවක් සිදුව ඇති බවත් එමඟින් රටට විශාල මූල්‍යමය පාඩුවක් සිදුව ඇති බවත් කාරක සභාවේ මූලික නිගමනය වේ.

කාරක සභාව විසින් විමර්ශනය කරන ලද එක් එක් කරුණ සම්බන්ධයෙන් දෙන ලද නිර්දේශ මෙම වාර්තාවේ පහතින් “කාරක සභාවේ නිර්දේශ” යටතේ දක්වා ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන් විසින් ආයතනික වශයෙන් කර ඇති වැරදි සම්බන්ධයෙන් සුදුසු විමර්ශනයන් සිදු කරන ලෙසටත් එලෙස වැරදි කර ඇති නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා ලෙසට අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට / ගණන්දීමේ නිලධාරීන්ට කාරක සභාව විසින් දැනටමත් නිර්දේශ ලබාදී ඇති අතර, එලෙස ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරි කාරක සභා රැස්වීම්වලදී විමසා බැලීමට කටයුතු කරනු ලැබේ.

තවද, මෙම වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලා අනුමත කර උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුව ඇති නීති විරෝධී සහ අපරාධී ක්‍රියා සම්බන්ධයෙන් විමර්ශනයන් සිදුකර, ඒවාට දායක වී ඇති පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන සුදුසු දඬුවම් පැමිණවීමට සුදුසු ආයතනයක් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා නීතිපති වෙත ඉදිරිපත් කරන ලෙසට ද මෙම කාරක සභාව යෝජනා කර සිටී.

ඒ සඳහා මෙම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින්, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත යොමු කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.

කාරක සභාවේ නිර්දේශ

නිර්දේශය - 01

විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා අදාළ කාලසීමාවේදී බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කර අභ්‍යන්තර විමර්ශනයක් සිදුකර මාසයක් තුළ (2025.05.02 දිනට පෙර) කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී.

නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම්- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
(අදාළ වාර්තාව කාරක සභාව වෙත ලැබී තිබෙන අතර එය ඇමුණුම 1 ලෙස දක්වා ඇත.)

නිර්දේශය - 02

එසේ ආනයනය කරන ලද විද්‍යුත් වාහන අතුරින් මෙතෙක් මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකළ වාහන සම්බන්ධයෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ද අවශ්‍ය සහය ලබාගෙන විමර්ශනයක් සිදුකර කාරක සභාව වෙත වාර්තා කරන ලෙස නිර්දේශ කරන ලදී.

නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

නිර්දේශ - 03

මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කොට බලපත්‍ර කොන්දේසි ප්‍රකාර කාලරාමුව තුළ දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකළ වාහන සඳහා රජයට අයවිය යුතු බදු මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකසා අදාල බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස,

නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

<u>නිර්දේශය - 04</u>

මෙම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නිර්දේශ කරන ලදී.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

පාර්ලිමේන්තුවේ මහ ලේකම් - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

<u>නිර්දේශය - 05</u>

ජාතික විගණන කාර්යාලය විසින් 2024 සැප්තැම්බර් 05 දිනැතිව නිකුත් කර ඇති මෙම විමර්ශනයට පාදක කොටගත් විශේෂ විගණන වාර්තාවේ ඇති තොරතුරු අනුව අදාළ නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව ආයතනික වශයෙන් ගතයුතු විනය ක්‍රියාමාර්ග ගත යුතු බව හා එම වාර්තාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල බලධාරීන් විසින් පියවර ගත යුතු බව නිර්දේශ කරන ලදී.

ඇමුණුම්

ඇමුණුම 1

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් හට පූර්ණවිද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය

2025.03.02 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් හට පූර්ණවිද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කරුණු විමසීමෙන් අනතුරුව දැනුම් දුන් පරිදි සහ 2025 අප්‍රේල් 08 දිනැති සහ PG/LEG/COPA/02/Special(10)01 අංක දරණ ලිපිය පරිදි විදේශ කටයුතු විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර අභ්‍යන්තර විමර්ශනයක් සිදු කිරීමට කරන ලද දැන්වීම පරිදි මෙම වාර්තාව කමිටුව විසින් සකස් කර ඉදිරිපත් කරන්නෙමු.

I. ජේ.එස්. ප්‍රසාද් පියසේන, අතිරේක ලේකම්(පාලන) විදේශ රැකියා අංශය - සභාපති
II. කේ.ඒ.එස්. හේමකාන්ති, අධ්‍යක්ෂ ජනරාල්(ක්‍රමසම්පාදන) - සාමාජික
III. සී.පී. ලොකුගලප්පත්ති, ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
IV. කේ. නිකාරිල්කාන්ත්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) - සාමාජික

2024.09.20 දිනැතිව සහ MOL/POL/01/2022 – iii අංක දරණ ලිපිය මගින් අතිරේක ලේකම් (පාලන) ජේ. එස්. ප්‍රසාද් පියසේන නමින් යොමු කරන ලද ලිපියට අදාලව යොමු කළ හා 2024.10.30 දිනැතිව විදේශ රැකියා අංශය විසින් භෞතිකව බාර ගත් ලිපිගොණු මෙම කමිටුවේ අධ්‍යනයට යොමු විය. එම ලිපිගොණු යොමු කළ ලිපිය සහ ලිපිගොණු සම්බන්ධ තොරතුරු ඇමුණුම 01 මගින් දක්වා ඇත.
මෙම ලිපිගොණු අතුරින් බලපත්‍ර වලට අදාල ලිපිගොණු අංක MOL/FE/EVP/501 සිට MOL/FE/EVP/1077 දක්වා වන ගොණු හා ඇමුණුම 02 ද සඳහන් ගොණු හැර සෙසු සියළු ලිපිගොණු වල මුල් පිටපත් ගොණු මේ වන විට අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු වෙනුවෙන් එම කොමිෂන් සභා භාරයට ගෙන ඇත. එබැවින් මෙම කමිටුවේ අධ්‍යනයට භාජනය කරනු ලැබුවේ විදේශ රැකියා අංශය භාරයේ ඇති ඡායා පිටපත් ගොණු වල අන්තර්ගත ලේඛනයන්ය. මීට අමතරව අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ ඇතුළත් ගොණු වාර්තාව සැකසීමට උපයෝගී කරගන්නා ලදී.

1. පසුබිම

1.1. 2022 වසරේ විදේශ රැකියා විෂයය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත පැවරී තිබූ අවස්ථාවේ එවකට මතුව තිබූ විදේශ සංචිත හිඟයට පිළියමක් ලෙස විවිධ ප්‍රවේශයන් යෝජනා වී ඇති අතර වැඩි වැඩියෙන් විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීමද ඉන් එක් යෝජනාවක් වී ඇත. එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් උපයන මුදල් මහබැංකුව අනුමත ප්‍රේෂණ යොමු කිරීමේ ක්‍රමවේදයන්ගෙන් බැහැරව මෙරටට යොමු කිරීම ද ඒ වන විට බරපතල ගැටළුවක් බවට පත්ව තිබී ඇත. එබැවින් බැංකු පද්ධතිය හරහා මෙරටට ප්‍රේෂණය යොමු කිරීම දිරිමත් කිරීම වෙනුවෙන් විවිධ දිරිගැන්වීම් යෝජනා ක්‍රම හඳුන්වාදීම පිණිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත 2022.06.17 දිනැතිව "නිත්‍යානුකූල මාර්ග ඔස්සේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා විගමනික සේවකයන්ට දිරිගැන්වීම් ලබා දීම" යන යොමුවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. එම සංදේශය මගින් මෙරටට අනුමත බැංකු හරහා යොමු කෙරෙන ප්‍රේෂණ ප්‍රමාණය මත විශේෂ තීරු බදු රහිත දීමනා ක්‍රමයක් සහ දෙමුහුන් විදුලි වාහන (Hybrid Electric Vehicle) ආනයනය කිරීමට බලපත්‍රයක් ලබා දීමට යෝජනා කර ඇත. අමාත්‍ය මණ්ඩලය

විසින් මෙම යෝජනාව සම්බන්ධයෙන් අධ්‍යනය කර නිර්දේශ ඇතුළත් වාර්තාවක් ලබා දීමට කමිටුවක් පත් කිරීමට අමප/22/0860/524/008 හා 2022.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දන්වා ඇත.

1.2. එම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි යෝජනාවලිය සම්බන්ධයෙන් අධ්‍යනය කළ කමිටුව ලබාදුන් වාර්තාව 2022.07.23 දිනැති සහ ML/ES/8/1/2 අංක දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත.

1.3. මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර 2022.08.08 දිනැතිව ML/ES/8/1/2 අංකයෙන් විදුත් යතුරුපැදි ගෙන්වීමට ප්‍රේෂණ යොමු කරන ලද කාලය 2022.05.01 දින සිට 2023.04.30 දින දක්වා ද, විදුලි වාහන සඳහා ප්‍රේෂණ යොමු කරන ලද කාලය 2022.05.01 දින සිට 2022.12.31 දින දක්වා ද සැලකීමට සහ විගමණික ශ්‍රමිකයා යන්න එතෙර රැකියාවක නියුතු මිනැම ශ්‍රී ලාංකිකයකු ලෙස අර්ථ දැක්වීමට අමාත්‍ය මණ්ඩල සටහනක් ද අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල සටහන් මඟින් කරන ලද යෝජනාද සැලකිල්ලට ගෙන අමප/22/1028/625/001 හා 2022.08.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමේ ලිපිය මඟින් එම යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

1.4. එම අනුමැතිය පදනම් කර ගනිමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් අංක MFE/DEV/HOB/03/VOL ii හා 2022.08.31 දිනැතිව 02/2022 චක්‍රලේඛය මඟින් එතෙර රැකියාවල නියුතු ශ්‍රීලාංකිකයින් විසින් මෙරට බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කර ඇති විදේශ මුදල් ප්‍රමාණයෙන් අවම වශයෙන් 50%ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර ඇති විගමණික ශ්‍රමිකයන් වෙනුවෙන් සැම වසර පහකට වරක් වාහනයක් ආනයනය කිරීමට හැකිවන බලපත්‍ර ලබා දීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාශයට පත් කර ඇත.

1.5. මෙහිදී ණයවර ලිපිය නිකුත් කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රතිලාභියාගේම බැංකු ගිණුමෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා අදාළ සමාගමට මාරු කළ යුතු බව දක්වා ඇත. (වාහන ආනයනය කිරීමේ සම්පූර්ණ පිරිවැය ප්‍රතිලාභියා විසින් ප්‍රේෂණය කර ඇති මුදලින් දරන බව සහතික කිරීමට සාක්ෂි තිබිය යුතු බව දක්වා ඇත.) වාහනයේ පිරිවැය ප්‍රතිලාභියා විසින් අදාළ පාර්ශවයට ගෙවිය යුත්තේ විදේශ මුදලින් පමණක් බවත් අදාල රජයේ බදු මුදල, ප්‍රතිලාභියා විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එවන ලද විදේශ විනිමය පරිවර්තනය කර රුපියල් වලින් ගෙවිය යුතු බවත් දක්වා ඇත. එතෙර රැකියා වල නියුක්ත පුද්ගලයාමලත් ශ්‍රී ලාංකිකයින් විසින් මෙරටට ප්‍රේෂණය කරන ලද විදේශ මුදල් ප්‍රමාණය සහ රුපියල් වලට පරිවර්තනය කරන ලද මුදල සහ තම විදේශ විනිමය ඉතුරුම් ප්‍රමාණය ඇතුළුව මුළු වාර්ෂික ප්‍රේෂණ ප්‍රමාණය සඳහන් කරමින් තහවුරු කිරීමේ ලිපියක් අදාළ බැංකුව විසින් ලබා දිය යුතු බව ද දක්වා ඇත.

1.6. මෙම යෝජනා ක්‍රමය යටතේ විදුලි වාහනයක් ආනයනය කිරීම සඳහා වන අයදුම්පත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ (www.labourmin.gov.lk) හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (www.slbfe.lk) වෙබ් අඩවි තුළින් බාගත කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සියළුම ලිපි ලේඛන සහිතව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට භාර දීමට හෝ/ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමට අවස්ථාව සලසා දී ඇත. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය හා අනෙකුත් ලියකියවිලි එම ශ්‍රී ලාංකිකයා හෝ ඔහු / ඇය විසින් ලිඛිතව බලය පවරන ලද අයෙකු මඟින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව අමාත්‍යාංශය විසින් බලපත්‍රය නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වාහන ආනයන බලපත්‍රය නිකුත් කිරීමට විධිවිධාන සලසා තිබී ඇත.

1.7. තවද 2022.08.31 දිනැතිව නිකුත් කරන ලද අංක 2/2022 දරණ දරණ චක්‍රලේඛය, 2022.09.09 දිනැතිව නිකුත් කරන ලද 2/2022(i) චක්‍රලේඛය සහ 2022.09.16 දිනැතිව නිකුත් කළ චක්‍රලේඛ අංක 22/2022(ii) පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට 2022.10.11 සහ ML/ES/8/1/2/2022 යන අමාත්‍ය මණ්ඩල සටහන ඉදිරිපත් කර ඇත. එම චක්‍රලේඛ මඟින් ආනයනය කරනු ලබන වාහන වසර දෙකකට පෙර තෙවන පාර්ශ්වයකට පවරන්නේ නම් පැවරීමේ බදු ලෙස වාහනයේ CIF වටිනාකමින් 10%ක් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් ගෙවීමට කටයුතු කළ යුතු බවට 2/2022(i) චක්‍රලේඛ සංශෝධනය මඟින් සිදු කර ඇත. තවද

2

එමගින් ආනයනය කළ හැකි වාහනයේ උපරිම CIF වටිනාකම සංශෝධනය කිරීම, බැටරි සම්බන්ධ විධිවිධාන බලපත්‍ර නිකුත් කිරීමේ තීරක බලය සහ පාවිච්චි නොකළ වාහන යන්න අර්ථ දැක්වීම කර ඇත. 2/2022(ii) චක්‍රලේඛ සංශෝධනය මගින් HS කේත සංශෝධනය සහ වසර 5ක කාලයක් යන තෙක් පැවරීමට නොහැකි වන විධිවිධානයට යටත්ව බලලත් නියෝජිතවරයකුට/ බලලත් බෙදා හරින්නකුට මාදිලි තුනක වාහන තුනක් ආනයනයට අවසර ලබා දීමට අවස්ථාව සලසා දී ඇත.

1.8. 2022.11.24 දිනැති සහ අංක ML/ES/8/1/2-2022 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් විදුලි මෝටර් රථ සඳහා වන සුඛෝපභෝගී බද්ද අදාල වන පි.ර.ගැ (CIF) සීමාව සංශෝධනය කිරීමට වන යෝජනාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2023.01.16 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දුන් බව අමප/22/1916/625/001-III(A) අංක හා 2023.01.24 දිනැති තීරණ දැනුම් දීමෙන් දන්වා ඇත.

1.9. 2023.04.28 සහ ML/ES/8/1/2-2023 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් බලපත්‍ර සඳහා සුදුසුකම් ලැබීමට ප්‍රේෂණ යොමු කළ යුතු කාලය දීර්ඝ කිරීමට ඉල්ලා ඇති අතර අමප/23/0843/625/018 අංක හා 2023.05.23 දිනැති අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ ලිපිය මගින් එම කාල සීමා 2023.09.15 දින දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද බව දන්වා ඇත.

1.10. මෙරට සිට විදේශීය රටවල විවිධ ආයතන සඳහා පෞද්ගලිකව නිදහස් සේවා සපයමින් මෙරටට විදේශ විනිමය ගෙන එනු ලබන ශ්‍රී ලාංකිකයින්වද මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් කරගැනීමට මෙම අමාත්‍යාංශය විසින් 2023.06.21 දිනැතිව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අවස්ථාවේ ක්‍රියාත්මක කිරීම යෝග්‍ය නොවන බවට 2023.07.11 දිනැති හා අමප/23/1173/625/018-I අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා ඇත.

1.11. 2023.12.22 සහ ML/ES/8/1/2-2023 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් බලපත්‍ර සඳහා සුදුසුකම් ලබන පරිදි ප්‍රේෂණ යොමු කළ අයවළුන්ට බලපත්‍ර අයදුම් කිරීමේ කාලය 2024.06.30 දින දක්වා දීර්ඝ කර පළමු අදියර නිමා කිරීමටත්, 2023.06.01 සිට 2024.05.31 දක්වා යොමු කරන ලද ප්‍රේෂණ සලකා නව දෙවන අදියරක් ආරම්භ කිරීමටත්, වාහනය ලියාපදිංචි කර CIF අගයෙන් 10% ගෙවා හිමිකම අවස්ථාවක පැවරීමටත් දෙවන අදියර සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීමටත් යෝජනා කර ඇත. දෙවන අදියරක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය එකඟ නොවන බව හා වාහනය පැවරීමේ සහ බලපත්‍ර අයදුම් කිරීමේ කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024.01.25 දිනැති හා අමප/23/2522/625/018-III අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා ඇත.

2. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2.1. මෙම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කටයුතු කරන ලද මාණ්ඩලික නිලධරයන් කිසිවෙකුත් මෙම අමාත්‍යාංශය යටතේ සේවය කරනු නොලබන බැවින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සිදු කළ ආකාරය සම්බන්ධයෙන් කරුණු ඉහතින් දක්වන ලද ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් පමණක් ලබා ගන්නා ලදී.

2.2. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2/2022 හා රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන් වෙත පූර්ණ විදුලි වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය යන ශීර්ෂයෙන් යුතුව 2022.08.31 දිනැතිව නිකුත් කළ චක්‍රලේඛ විධිවිධාන යටතේ වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත් 1077 සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත. ඉදිරිපත් වී ඇති අයදුම්පත් පිළිබඳ තොරතුරු ඇමුණුම 03 මගින් දැක්වේ.

2.3. යම් පුද්ගලයක් විසින් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රයක් ලද විට එම අයදුම්පත් වෙනුවෙන් නව ලිපි ගොනුවක් ආරම්භ කර ඇති අතර එම ලිපිගොනුවට අංක ලබා දීමේදී MOL/FE/EVP/"අනුක්‍රමික අංකය" යන ආකෘතිය භාවිතා කර ඇත. අයදුම්පත්‍රයක් ලැබූ පසු එය දින මුද්‍රාවක් තබා ලේඛනගත කිරීම සම්බන්ධයෙන් තොරතුරක් ලිපිගොනු අනුව අනාවරණය නොවුනි.

3

2.4. අයදුම්පත සමඟ යොමු කළ තොරතුරු තහවුරු කර ගැනීම් වලින් අනතුරුව බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර ඇති අවස්ථාවේ ලිපිගොනු ගොණුව අංකනය කළ අංකයම බලපත්‍ර අංක ලෙස ද භාවිතා කර ඇත. නිකුත් කළ බලපත්‍ර වල තොරතුරු ඇමුණුම 04 මගින් දැක්වේ.

2.5. අයදුම්පත සමඟ ඉදිරිපත් කර ඇති විදේශ රැකියාවක නිරත වූ බව සනාථ කෙරෙන ලේඛනය නැවත සනාථ කර ගැනීමක් සිදුව ඇති බව නිරීක්ෂණය නොවන අතර මෙරටට යොමු කරන ලද ප්‍රේෂණ ප්‍රමාණය අදාල බැංකු මගින් තහවුරු කර ගත් ආකාරය ගොණු තුළින් ප්‍රමාණවත් පරිදි නිරීක්ෂණය නොවුනි.

2.6. යම් අයකු ඉදිරිපත් කර ඇති අයදුම්පතක ඇති යම් යම් අඩුපාඩුවක් නිසා හෝ චක්‍රලේඛ විධිවිධාන පරිදි මූලික සුදුසුකම් නොමැති වීම මත යම් අයදුම් පත්‍රයක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථා 65 නිරීක්ෂණය විය. බලපත්‍ර ලබා දීම ප්‍රතික්ෂේප කළ අයදුම්පත්‍ර වල තොරතුරු ඇමුණුම 05 මගින් දැක්වේ.

2.7. යම් අයදුම්පත්‍රයක් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් බලපත්‍ර වලට භාවිතා කරන අංක අනුපිළිවෙලින් බැහැරව, අනුක්‍රමික අංක ශ්‍රේණියකින් සමන්විත නොවී අපිළිවෙල අංක ශ්‍රේණියකින් යුතුව බලපත්‍ර නිකුත් කර ඇත. එමෙන්ම බලපත්‍ර අංක සහ නිකුත් කළ බලපත්‍ර තොරතුරු ඇතුළත් ලේඛනයක් විධිමත් ලෙස නඩත්තු නොකිරීමෙන් බලපත්‍ර තොරතුරු නිවැරදිව ලබා ගැනීමට බාධාවක් වී ඇත.

2.8. මෙම බලපත්‍ර ලබා දීමට අදාලව පරිගණකයේ නඩත්තු කරන ලද විද්‍යුත් තොරතුරු ලේඛනයේ තොරතුරු ද නිසි පරිදි ඇතුළත් කළ බවට, නැවත පරීක්ෂා කිරීමක් සිදු කර ඇති බවක් නිරීක්ෂණය නොවන අතර එම තොරතුරු ගොණු වලට අනුකූලව යාවත්කාලීන වීමක් ද සිදුව ඇති බව නිරීක්ෂණය නොවේ.

2.9. අයදුම්පත් ලිපිගොණු සම්බන්ධයෙන් ලිපිගොණු ලේඛනයක් නඩත්තු නොකිරීමෙන් ලිපිගොණු අංකය ද්විත්වකරණය වී ඇති අවස්ථා ඇති වී ඇති බව කමිටුව නිරීක්ෂණය කරන අතර ලිපිගොණු අංකය බලපත්‍ර අංකයට භාවිතා කිරීමෙන් බලපත්‍ර අංකය ද ද්විත්වකරණයට ලක් වී ඇත. ද්විත්වකරණය වූ අංකයන් පසුව හඳුනා ගෙන බලපත්‍ර අංක වෙනස් බව දැක්වීමට රෝම ඉලක්කම් මගින් අංකනය කළද ඉන් ද්විත්වකරණ දෝශය වැළැක්වී නොමැති අතර එක් අංකයකින් එක් බලපත්‍රයකට වඩා නිකුත්ව නැති බවට ඇති විශ්වාසය තහවුරු කිරීමට එය සමත් වී නොමැත. එසේ අංක ද්විත්වකරණය වී නිකුත් කර ඇති බලපත්‍ර වල තොරතුරු ඇමුණුම 06 මගින් දැක්වේ.

2.10. බලපත්‍රයක් නිකුත් කිරීමේදී මාස 06ක කාලයක් වෙනුවෙන් වලංගු වන පරිදි නිකුත් කර තිබේ. බලපත්‍ර හිමියාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය, විදෙස් රැකියාවේ නිරත වූ රට, වාහනය ආනයනය කිරීමට පහසුකම් සලසන ආයතනය, ආනයනය කරනු ලබන වාහන මාදිලිය, ආනයනය කරනු ලබන වාහනයේ උපරිම CIF වටිනාකම, වාහන ආනයනයට වලංගු බලපත්‍ර කාලය යන තොරතුරු බලපත්‍රයට ඇතුළත් කර ඇති අතර මුදල් හා ආර්ථික ස්ථායිකරණ අමාත්‍යාංශය වෙත පිටපතක්ද, මහ බැංකුව වෙත එක් පිටපතක්ද, ශ්‍රී ලංකා රේගුව වෙත පිටපතක්ද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පිටපතක්ද, විගණකාධිපති වෙත පිටපතක්ද, ණයවර ලිපි විවෘත කිරීමට අපේක්ෂිත බැංකුව වෙත පිටපත්ද යන ලෙසට බලපත්‍ර පිටපත් යොමු කරමින් බලපත්‍ර නිකුත් කර ඇත. නිකුත් කර ඇති බවට හඳුනා ගත් බලපත්‍ර වල පිටපත් ඇමුණුම 07 ලෙස සංයුක්ත තැටියකින් ඉදිරිපත් කර ඇත.

2.11. වාහන ආනයනයට වලංගු බලපත්‍ර කාලය ඉක්මයාම, ආනයනය කරනු ලබන වාහන මාදිලිය වෙනස් කර ගැනීම, වාහනය ආනයනය කිරීමට පහසුකම් සලසන ආයතනය වෙනස් කර ගැනීම හෝ ආනයනය කරනු ලබන වාහනයේ උපරිම CIF වටිනාකම වෙනස් කර ගැනීම සඳහා කරනු ලැබූ ඉල්ලීම් පදනම් කර ගනිමින් එතෙක් නිකුත් කර තිබූ බලපත්‍රලාභියාගේ බලපත්‍රය අවලංගු කර නව බලපත්‍රයක් නිකුත් කර ඇත. එසේ එක් බලපත්‍රයක් අවලංගු කර නව බලපත්‍ර නිකුත් කළ බලපත්‍ර තොරතුරු ඇමුණුම 08 මගින් දක්වා ඇත.

2.12. මෙම බලපත්‍ර උපයෝගී කර ගනිමින් ආනයනය කළ වාහන තොරතුරු ශ්‍රී ලංකා රේගුව මගින් ලබා දී ඇත. එම ආනයනික වාහන තොරතුරු ඇමුණුම් අංක 09 මගින් දැක්වේ.

2.13. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් ලබා දුන් අනයනික වාහන අතුරින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද වාහන තොරතුරු ඇමුණුම අංක 10 මගින් දක්වා ඇත. යාවත්කාලීන කරන ලද තොරතුරු ලබා දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙතින් ඉල්ලා ඇති අතර 2025.04.30 වන විටත් එම තොරතුරු නොලද බැවින් පෙර ලබා දුන් තොරතුරු ඇතුළත් කරන ලදී. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු ලද විගස එම තොරතුරු ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත.

3. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී මතු කළ කරුණු

3.1. ඉහත 1.2 ඡේදයෙන් දක්වන ලද කමිටුවේ නිර්දේශ පරිදි බලපත්‍ර නිකුත් කිරීම ආනයන අපනයන පාලක වෙත නොපවරා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් එම කටයුතු සිදු කිරීමට පදනම් වූ තොරතුරු විදේශ රැකියා අංශය වෙත බාර දුන් ලිපිගොණු වල අන්තර්ගත නොවේ. එම කමිටු සාමාජිකයන් කාරක සභා අවස්ථාවේ කරුණු දැක්වූ පරිදි වාහන ආනයනය නවතා ඇති අවස්ථාවක වාහන ආනයනයට බලපත්‍රයක් ලබා දීමක් සිදු කල යුතු නිසා බලපත්‍ර නිකුත් කිරීමට ආනයන අපනයන පාලක වෙත පැවරීමට යෝජනා කළ බවට කරුණු දක්වන ලදී. ලිපිගොණු පරීක්ෂාවෙන් එම කරුණු සනාථ වන හෝ නොවන කරුණු සොයා ගත නොහැක. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් අනතුරුව 2022.08.19 දිනැති වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදී චක්‍රලේඛය නිකුත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා වී ඇති නමුත් සාකච්ඡා සටහන් ගොණුවල අන්තර්ගත නොවන බැවින් රැස්වීමේදී එලැඹි තීරණ සම්බන්ධයෙන් අදහසක් ලබා ගැනීමට හැකියාවක් නොමැත. නමුත් ආනයන අපනයන පාලක විසින් අංක 2298/55 හා 2022 සැප්තැම්බර් 23 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2022 අංක 16 දරණ ආනයන අපනයන (පාලන) රෙගුලාසි අනුව විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් නිකුත් කළ බලපත්‍ර මත වාහන ආනයනය කිරීම සඳහා අවසර ලබා දී ඇත.

3.2. එසේනර රැකියාවක නියුතු ශ්‍රී ලාංකිකයකු යනු මිනැම විදේශ රටක රැකියාවක යෙදෙන ශ්‍රී ලාංකිකයකු ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම් කර ගනිමින් 02/2022 චක්‍රලේඛයෙන් අර්ථ නිරූපණය කර ඇති බැවින් බලපත්‍ර නිකුත් කිරීමේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය අනිවාර්ය අවශ්‍යතාවයක් වී නොමැත. කෙසේ වෙතත් විමර්ශන කටයුතු වෙනුවෙන් මෙම යෝජනා ක්‍රමය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ පුද්ගලයන්ගේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය පරීක්ෂා කරවා ඇත. ඒ අනුව පුද්ගලයන් 360 ලියාපදිංචි වී විදේශ රැකියා වල නිරත වී ඇති බව විදේශ සේවා නියුක්ති කාර්යාංශය සනාථ කර ඇත. එම තොරතුරු ඇමුණුම 11 මගින් දැක්වේ.

3.3. මෙම යෝජනා ක්‍රමය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ පුද්ගලයන්ගේ විදේශගත වීම පරීක්ෂා කිරීම සඳහා ඔවුනගේ ආගමන විගමන දත්ත ලබා දෙන ලෙසට ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියද මෙතෙක් එම තොරතුරු විදේශ රැකියා අංශය වෙත මෙතෙක් යොමුව නැති නිසා ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට කමිටුවට හැකියාවක් නොමැත.

3.4. විදේශගත වූ බවට තහවුරු නොවූ පුද්ගලයින් හතර දෙනෙකු (04) වෙනුවෙන් වාහන බලපත්‍ර නිකුත් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණු බවට විමසීම් කළද ඔවුනගේ ආගමන විගමන දත්ත පරීක්ෂා කිරීමකින් තොරව කමිටුවට නිරීක්ෂණයක් දැක්විය නොහැක. එසේ විදේශ ගත නොවූ බව දැක්වෙන MOL/FE/EVP/397, MOL/FE/EVP/450, MOL/FE/EVP/539, MOL/FE/EVP/956 යන බලපත්‍රලාභීන් සිව්දෙනා සම්බන්ධ තොරතුරු ඇමුණුම 12 මගින් දැක්වේ. මෙම බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශ 04 මගින් මේ සම්බන්ධයෙන් සිදු කරගෙන යනු ලබන විමර්ශනය සඳහා අදාල ලිපිගොණු මුල් පිටපත් සහ ප්‍රකාශයන් 2025.03.03 දිනැතිව විදේශ රැකියා අංශයෙන් ලබා ගෙන ඇත.

3.5. අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ 2-IV විධිවිධාන ප්‍රකාරව මෙම ක්‍රමවේදය යටතේ නිකුත් කළ සියළුම බලපත්‍ර පදනම් කර ගනිමින් ආනයනය කළ වාහන සියල්ලක්ම 2024.09.30 දිනට පෙර මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර අවසන් කල යුතු වේ. ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ඇතත් මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව ලියාපදිංචි නොකරන ලද වාහන තොරතුරු ඇමුණුම 13 දැක්වේ. 2024.11.26 දිනට ලබා දුන් තොරතුරු අනුව මෙම වාර්තාව සකසා ඇතත් මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් නව තොරතුරු ලබා දුන් විගස මෙතෙක් ලියාපදිංචි නොකරන ලද යාවත්කාලීන ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

3.6. ශ්‍රී ලංකා මහබැංකුව යොමු කරන ලද පැමිණිල්ලකට අනුව මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් ද, විදේශ රැකියාවක නිරත වීමෙන් තොරව උපයා ගත් මුදල් ද ශ්‍රී ලංකාවට යොමුකර මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට තැත්කිරීම් සම්බන්ධයෙන් ද විමර්ශන සිදු කරන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විදේශ රැකියා අංශය වෙත වාර්තා කර ඇත.

4. කමිටුවේ විශේෂ නිරීක්ෂණ සහ යෝජනා

4.1. 2024.01.25 දිනැති හා අමප/23/2522/625/018-III අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර නිකුත් කිරීම 2024.06.30 දිනෙන් අවසන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර බලපත්‍රයේ විධිවිධාන අනුව ආනයනය කළ වාහන 2024.09.30 දිනට පෙර බලපත්‍රලාභියා විසින් මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර අවසන් කළ යුතුය. මෙම ක්‍රමය යටතේ ආනයනික වාහන මෙතෙක් ලියාපදිංචි නොකර සිටීම බලපත්‍ර කොන්දේසි කඩකිරීමකි. එබැවින් මෙම තත්වය සැලකිල්ලට ගෙන එම වාහන ලියාපදිංචි කරන දිනට වලංගු බදු ක්‍රමවේදයට යටත් කර සැලකිය යුතු අතිරේක දණ්ඩන මුදලක් ද අය කර ලියාපදිංචිය සිදු කිරීම සුදුසු බවට කමිටුව යෝජනා කර සිටින්නෙමු.

4.2. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 53 (3) වගන්තියෙන් "ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බැහැර යන සෑම ශ්‍රී ලාංකිකයකු විසින්ම, එසේ පිටත් වී යාමට පෙර කාර්යාංශ වෙත ලියාපදිංචි විය යුතුය" යනුවෙන් නියම කර ඇත. එසේම රැකියා සඳහා විදේශ ගත වන සහ රැකියා නිම කර ආපසු පැමිණෙන පුද්ගලයන්ගේ තොරතුරු පවත්වාගෙන යාමේ වගකීම ද එම කාර්යාංශයට පවරා ඇත. එබැවින් සියලු රාජ්‍ය ආයතන වල විදේශ ශ්‍රමිකයා යන්න භාවිතා කරන සෑම අවස්ථාවකම විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ නියමයන්ට අනුකූලව විදේශ රැකියාවකට යොමුවන්නකු පමණක් සැලකිය යුතු බවට කමිටුව විසින් නිර්දේශ කෙරේ.

ජේ.එස්. ප්‍රසාද් පියසේන	කේ.ඒ.එස්. හේමකාන්ති	සී.පී. ලොකුගලප්පත්ති	කේ. තිකරිල්කාන්ත්
සභාපති	සාමාජික	සාමාජික	සාමාජික